

# ප්‍රසම්පාදනයේ දී සිදුවන දූෂණ පිළිබඳ අනතුරු ඇඟවීමේ සංඥා දැනගන්න

## තොරතුරු පත්‍රිකාව

**රාජ්‍ය අංශයේ සිදු වන ප්‍රසම්පාදනය දූෂණයට ගොදුරු වන්නේ එයට විශාල මහජන මුදල් ප්‍රමාණයක් සම්බන්ධ විය හැකි බැවිනි.**

**ප්‍රසම්පාදනයේ දූෂණය මගින් සාධාරණ තරගකාරීත්වය පළුදු කර, පිරිවැය වැඩි කර, රාජ්‍ය අංශයේ අවංකත්වය පිළිබඳ විශ්වාසය හීන කරයි.**

### දැනුවත් වන්න

සැපයුම්කරුවන් ලබා ගැනීමේ සිට ගිවිසුම් හා ගෙවීම් අනුමත කිරීම දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඕනෑම අදියරකදී දූෂණ සිදුවිය හැකි බව අපි දනිමු.

ඔබට කිසියම් සැක කටයුතු ක්‍රියාවක් හඳුනා ගැනීමට හා වාර්තා කිරීමට හැකි වන පරිදි, ප්‍රසම්පාදනයේ ඇති අවදානම් පිළිබඳව දැනුවත් වීම ඉතා වැදගත් වේ.

### IBAC වෙත වාර්තා කිරීම ප්‍රසම්පාදනයේදී සිදු වන දූෂණය වැලැක්වීමට උපකාරී වේ

IBAC යනු වික්ටෝරියාවේ ස්වාධීන, දූෂණ විරෝධී හා පොලිස් අධීක්ෂණ ආයතනයයි. අපගේ ප්‍රාන්තය තුළ අවංකත්වය ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව, රාජ්‍ය අංශයේ දූෂණ සහ පොලිස් විෂමාචාර වැළැක්වීමට සහ හෙළිදරව් කිරීමට අපි මෙහි සිටින්නෙමු.

අධ්‍යාපනය සහ වැළැක්වීම

IBAC | Strengthening Victoria's Integrity

අප කරන දෙයෙහි වැදගත් කොටසක් වන්නේ රාජ්‍ය අංශය තුළ භාවිතය සඳහා භාණ්ඩ හා සේවා බාහිර සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීමේ දී දූෂණ සිදු වීමේ අවදානම වැළැක්වීමට ක්‍රියා කිරීමයි.

ඔබ සේවනියුක්තයෙක් හෝ සැපයුම්කරුවෙකු ලෙස ප්‍රාදේශීය ආණ්ඩු සභාව හෝ වික්ටෝරියා පොලිසිය ඇතුළු රාජ්‍ය අංශයේ සේවය කරන්නේ නම්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ඇතිවිය හැකි අවදානම් පිළිබඳව ඔබ දැනුවත් විය යුතුය. ඔබ දූෂණ අවදානම් දකින විට, ඒවා හඳුනා ගන්නේ, වාර්තා කරන්නේ හා අඩු කරන්නේ කෙසේද යන්න ගැන ද ඔබ දැන සිටිය යුතුය.

## නිතර අසන ප්‍රශ්න

### ප්‍රශ්නය: ප්‍රසම්පාදනය යනු කුමක්ද?

පිළිතුර:
ප්‍රසම්පාදනය යනු බාහිර මූලාශ්‍රවලින් භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමේ ක්‍රියාවලියයි. එයට සැපයුම්කරුවන් ලබා ගැනීම, ගිවිසුම් සාකච්ඡා කිරීම, සහ විකුණුම්කරුවන් සමග සබඳතා කළමනාකරණය කිරීම වැනි ක්‍රියාකාරකම් ඇතුළත් වේ. ප්‍රසම්පාදනයේ ඉලක්කය වන්නේ ක්‍රියාවලියේ සාධාරණත්වය, විනිවිදභාවය හා වගවීම සහතික කරන අතර ම, අවශ්‍ය භාණ්ඩ හෝ සේවාවන් හැකි උපරිම අගයකට ලබා ගැනීමයි.

### ප්‍රශ්නය: ප්‍රසම්පදනයේ දී දූෂණය සිදු විය හැක්කේ කෙසේද?

පිළිතුර:
පුද්ගලයින් තම අධිකාරිය අවභාවිතා කරන විට හෝ පුද්ගලික වාසි සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය හසුරුවන විට ප්‍රසම්පාදනයේදී දූෂණ සිදුවිය හැකිය. සමහර පොදු දූෂිත ක්‍රියාවන් අතරට අල්ලස් ගැනීම, ලංසු වංචා කිරීම, අනුග්‍රහය දැක්වීම, සහ සැපයුම්කරුවන් හා රාජ්‍ය නිලධාරීන් අතර වංචනික හවුල් වීම ඇතුළත් වේ. උදාහරණයක් ලෙස, නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකර සැපයුම්කරුවෙකුට කොන්ත්‍රාත්තුවක් ප්‍රධානය කිරීම සඳහා නිලධාරියෙක් එම සැපයුම්කරුගෙන් අල්ලස් ලබාගත හැකිය.

### ප්‍රශ්නය. ප්‍රසම්දපානයේ දී වංචාව කවර ආකාරයෙන් දැකිය හැකිද?

පිළිතුර.

මූල්‍ය වාසියක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා පුද්ගලයෙකු හිතාමතාම රැවටිලිකාර හෝ වංක වන විට වංචාව සිදු වේ. එය ප්‍රසම්දපානයේ දී පොදුව සිදුවන දූෂණයකි.

වංචනික ක්‍රියාකාරකම් නිසා රාජ්‍ය අංශයේ ආයතනවලට මූල්‍යමය පාඩු හා කීර්තිනාමයට හානි සිදු විය හැකිය. එය රාජ්‍ය ආයතන හා සේවා කෙරෙහි මහජන විශ්වාසය හා උසස් බලාපොරොත්තු පළුදු කරයි.

ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදු වන වංචා පිළිබඳ පොදු උදාහරණවලට ඇතුළත් වන්නේ:

- සොරකම හා වංචාව
- සේවනියුක්තයන් විසින් භාණ්ඩ හෝ බඩු නාමාවලිය සොරකම් කිරීම
- ව්‍යාජ ඉන්වොයිසයන්
- මහජන මුදල් අවභාවිතය
- මූල්‍ය වාර්තා වංචාව.

### ප්‍රශ්නය: ඔබ අවධානය යොමු කළ යුතු අනතුරු ඇඟවීමේ සංඥා මොනවාද?

පිළිතුර:
ප්‍රසම්පාදනයේදී සිදු වන දූෂණ හා වංචා පෙන්නුම් කරන අනතුරු ඇඟවීමේ සංඥා කිහිපයක් තිබේ. ඒවාට ඇතුළත් වන්නේ:

- නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකර නිශ්චිත සැපයුම්කරුවන් හෝ කොන්ත්‍රාත්කරුවන් කෙරෙහි අනුග්‍රහය දැක්වීම
- සේවනියුක්තයන් විසින් බැඳියාව පිළිබඳ ගැටුම් ප්‍රකාශ කිරීමට අපොහොසත් වීම, හෝ සැපයුම්කරුවන්ගෙන් තෑගි හා ප්‍රතිලාභ ලබා ගැනීම
- ස්ථාපිත ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි හා

ලියකියවිලි අවශ්‍යතාවලට අනුකූල නොවීම

- සැපයුම්කරුවන් තෝරාගැනීමේ සහ ගෙවීම් අනුමත කිරීමේ ක්‍රියාවලීන්හි විනිවිදභාවයක් නොමැති වීම
- පක්ෂග්‍රාහී ලංසු තැබීම, තරගකාරිත්වය නොමැතිකම, හෝ අඩුගුණාත්මක බවක් ඇති භාණ්ඩ හා සේවාවන් පිළිබඳ කාර්ය මණ්ඩලය, සැපයුම්කරුවන් හෝ ප්‍රජාව වෙතින් පැමිණිලි ලැබීම
- උද්ධමිත මිල ගණන් සහිත ඉන්වොයිසි හෝ කිසි විටෙක ලබා නොදුන් භාණ්ඩ සහ සේවා සඳහා නිකුත් කළ ඉන්වොයිසි වැනි සැකසහිත ඉන්වොයිසි.

සුපරීක්ෂාකාරීව සිටීම සහ මෙම අනතුරු ඇඟවීමේ සලකුණු හඳුනා ගැනීම ප්‍රසම්පාදනය තුළ සිදු වන දූෂණ සොයා ගැනීම හා වැළැක්වීම සඳහා ඉතා වැදගත් වේ.

## ප්‍රශ්නය:
## සංවිධාන විසින් ප්‍රසම්පාදනය තුළ දූෂණ සිදු වීමේ අවදානම අවම කර ගන්නේ කෙසේද?

පිළිතුර:
ප්‍රසම්පාදනයේදී සිදුවන දූෂණ අවදානම අවම කිරීම සඳහා සංවිධානවලට ගත හැකි ක්‍රියාමාර්ග ගණනාවක් තිබේ. ඒවාට ඇතුළත් වන්නේ:

- පැහැදිලි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තිබීම
- වික්ටෝරියානු රාජ්‍ය අංශයේ ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම හා අනුගමනය කිරීම
- ආචාරධාර්මික ප්‍රසම්පාදන පිළිවෙත් පිළිබඳව සේවානියුක්තිකයන්ට නිතිපතා පුහුණුවක් ලබා දීම
- සේවානියුක්තිකයන්ට අවිශ්වාසයන් පිළිබඳව වාර්තා කිරීම සඳහා රහස්‍ය වාර්තාකරණ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම
- ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ඵලදායී අභ්‍යන්තර පාලනයන් සහ වෙනම රාජකාරි ස්ථාපිත කිරීම
- අහඹු හා විධිමත් කාල පරාසයන් තුළ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම හා ඇගයීම
- නිරත වීමට පෙර උචිත ක්‍රියශූරත්වය හරහා සැපයුම්කරුවන් ගැන කටයුතු කිරීම
- ලංසු තැබීමේ ක්‍රියාවලියේදී තරඟකාරිත්වය සහ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම

# දූෂණය දුටු සෑම අවස්ථාවකදී ම, එය වාර්තා කිරීම ඔබේ යුතුකමකි.

**ඔබගේ සේවා ස්ථානයේ ඇති බැඳියාව පිළිබඳ ගැටුම් ප්‍රකාශයටපත් නොකිරීම හෝ නිසි ලෙස කළමනාකරණය නොකිරීම ගැන ඔබට ගැටළු තිබේ නම්, ඔබ එය වාර්තා කළ යුතුය.**

**IBAC මහජන විශ්වාසය තහවුරු කිරීමට සහ රාජ්‍ය අංශය තුළ අවංකත්වය පවත්වා ගැනීමට කැපවී සිටී.**

**www.ibac.vic.gov.au** හි වාර්තා කිරීම සඳහා ආරක්ෂිත මාර්ගගත පෝරමය පුරවන්න

ඔබට මාර්ගගත පෝරමයට ප්‍රවේශ වීමට අපහසු නම්, වැඩිදුර සහාය සඳහා 1300 735 135 ඔස්සේ අප අමතන්න.

Interpreter

ඔබට පරිවර්තන සහාය අවශ්‍ය නම්, 13 14 50 ඔස්සේ පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවාව අමතන්න, නැතහොත් **www.ibac.vic.gov.au/mylanguage** වෙත පිවිසෙන්න



2023 අගෝස්තු



ibac | Strengthening Victoria's Integrity